15509

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation 17 . 11 . 2016

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) ඍජුව හෝ වක්‍රව පාලන කටයුතු සඳහා ජනතාවට සහභාගී වීමට ඉඩ ලැබෙන පාලන ක්‍රමය හඳුන්වනු ලබන්නේ,

(1) රාජාණ්ඩු ක්‍රමයක් ලෙස ය. (2) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් ලෙස ය.
(3) ඒකාධිපති පාලන ක්‍රමයක් ලෙස ය. (4) සමූහාණ්ඩු පාලන ක්‍රමයක් ලෙස ය.

(02) රාජාණ්ඩු ක්‍රමය වෙනුවට ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමේ ක්‍රියාවලිය ආරම්භ වූයේ,

(1) ක්‍රි.ව. 1688 සිදුවූ ඉංග්‍රීසි විප්ලවයෙන් පසුව ය.
(2) ක්‍රි.ව. 1776 ඇමරිකන් විප්ලවයෙන් පසුව ය.
(3) ක්‍රි.ව. 1789 ප්‍රංශ විප්ලවයෙන් පසුව ය.
(4) ක්‍රි.ව. 1917 රුසියන් විප්ලවයෙන් පසුව ය.

(03) ජනතාව විසින් ජනතාව උදෙසා පවත්වාගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය යනුවෙන් ප්‍රකාශ කරනු ලැබුවේ,

(1) ඒබ්‍රහම් ලින්කන් ය. (2) සීලර් ය.
(3) ජේ.ආර්.ලවල් ය. (4) ඒබ්‍රහම් ස්මිත් ය.

(04) බහුපක්ෂ ක්‍රමයක් හා ද්විපක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටවල නම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ඉන්දියාව හා කියුබාව යි.
(2) මහා බ්‍රිතාන්‍ය හා ඇමරිකා එක්සත් ජනපදය යි.
(3) ඉන්දියාව හා චීනය යි.
(4) ඉන්දියාව හා මහා බ්‍රිතාන්‍යය යි

(05) මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කරන ලද දිනය කුමක් ද?

(1) ක්‍රි.ව. 1948 දෙසැම්බර් 5 වන දිනය
(2) ක්‍රි.ව. 1948 දෙසැම්බර් 14 වන දින ය.
(3) ක්‍රි.ව. 1948 දෙසැම්බර් 10 වන දින ය.
(4) ක්‍රි.ව. 1948 දෙසැම්බර් 08 වන දින ය.



25

(06) මහජනතාව සතු පරමාධිපත්‍ය බලයට ඇතුළත් වන අංග සහිත වරණය කුමක් ද?

(1) දේශපාලන පක්ෂ, ප්‍රතිපත්ති, ජනතා යුතුකම්

(2) බහුවිධතාව, ජනමතය, බහුපක්ෂ ක්‍රමය

(3) පාලන බලතල, මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය

(4) මූලික අයිතිවාසිකම්, දේශපාලන පක්ෂ, ප්‍රතිපත්ති

(07) රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) භූමිය, ජනගහනය, පළාත් සභාව, ස්වාධිපත්‍යය.

(2) භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය.

(3) භූමිය, ජනගහනය, අධිකරණය, ස්වාධිපත්‍යය.

(4) භූමිය, ජනගහනය, පරමාධිපත්‍ය, ස්වාධිපත්‍යය.

(08) • රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ

• පුනරුදය

• වැඩවසම් ක්‍රමය බිඳ වැටී ධනවාදී ආර්ථිකයක් ගොඩනැගීම

• විද්‍යාත්මක දැනුම වර්ධනය

ඉහතින් දක්වා ඇත්තේ,

(1) ජාතික රාජ්‍යයකට පැවරෙන කාර්යයන් ය.

(2) ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණයන් ය.

(3) ජාතික රාජ්‍යයක දැකිය හැකි සුවිශේෂිතාවයන් ය.

(4) ජාතික රාජ්‍යය බිහිවීමට බලපෑ හේතූන් ය.

(09) ආණ්ඩුවක ප්‍රධාන අංග ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ව්‍යවස්ථාදායකය, විධායකය, පළාත් සභාවයි.

(2) ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණයයි.

(3) ව්‍යවස්ථාදායකය, විධායකය, ශ්‍රේෂ්ඨාධිකරණයයි.

(4) ව්‍යවස්ථාදායකය, අධිකරණය, ජනාධිපති කොමිෂන් සභාවයි.

(10) පහත දක්වා ඇති ප්‍රකාශවලින් රටක විධායකය සතු කාර්යයන් පෙන්නුම් කරන ප්‍රකාශය කුමක් ද?

(1) පාර්ලිමේන්තුවට නියෝජිතයන් තෝරා පත්කර ගැනීම සිදුකිරීම

(2) රටට අවශ්‍ය නීති කෙටුම්පත් කිරීම

(3) ව්‍යවස්ථාදායකය මගින් පනවන නීති ක්‍රියාවට නැංවීම

(4) යුක්තිය පසිඳලීමේ කාර්යය ඉටු කිරීම

(11) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පුරවැසියන් සතු මූලික යුතුකම් පිළිබඳව

(1) 28 වැනි වගන්තියෙන් දක්වා ඇත. (2) 23 වැනි වගන්තියෙන් දක්වා ඇත.

(3) 26 වැනි වගන්තියෙන් දක්වා ඇත. (4) 25 වැනි වගන්තියෙන් දක්වා ඇත.

(12) ශ්‍රී ලංකාවේ පළාත් සිතියමේ උතුරුමැද පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක වනුයේ,

(1) පොළොන්නරුව හා මඩකලපුව ය.

(2) අනුරාධපුර හා පොළොන්නරුව ය.

(3) කුරුණෑගල හා මාතලේ ය.

(3) අනුරාධපුර හා ත්‍රිකුණාමලය ය.

(13) ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා පරිපාලන බලතල විමධ්‍යගත කිරීම අනුපිළිවෙළින් දැක්වූ විට ලැබෙන පිළිතුර කුමක්ද?
(1) අමාත්‍යාංශ ලේකම් - දිස්ත්‍රික් ලේකම් - ප්‍රාදේශීය ලේකම් - ග්‍රාම නිලධාරී
(2) දිස්ත්‍රික් ලේකම් - ප්‍රාදේශීය ලේකම් - අමාත්‍යාංශ ලේකම් - ග්‍රාම නිලධාරී
(3) අමාත්‍යාංශ ලේකම් - ප්‍රාදේශීය ලේකම් - දිස්ත්‍රික් ලේකම් - ග්‍රාම නිලධාරී
(4) ප්‍රාදේශීය ලේකම් - දිස්ත්‍රික් ලේකම් - ආමාත්‍යාංශ ලේකම් - ග්‍රාම නිලධාරී

(14) සන්ධීය හෙවත් ෆෙඩරල් රාජ්‍යවල ප්‍රාදේශීය ආණ්ඩු ප්‍රාන්ත නමින් හඳුන්වයි. එම නම වෙනුවට "කැන්ටන්" නමින් තම ප්‍රාන්ත ආණ්ඩු හඳුන්වන්නේ කුමන රටේ ද?
(1) ප්‍රංශය (2) කැනඩාව (3) ස්විට්සර්ලන්තය (4) බ්‍රිතාන්‍ය

(15) ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ඒකීය ආණ්ඩුක්‍රමයක ආණ්ඩුව සතු බලතලයක් වන්නේ,
(1) මූල්‍ය කටයුතු (2) සෞඛ්‍යය
(3) අධ්‍යාපනය (4) පළාත් පාලනය

(16) බ්‍රිතාන්‍ය යුගයේ දී පළාත් මට්ටමින් රෙසිඩන්ට්වරයකු පත් කිරීම සිදුකරනු ලැබූ වර්ෂය වනුයේ,
(1) ක්‍රි.ව. 1814 ය. (2) ක්‍රි.ව. 1815 ය. (3) ක්‍රි.ව. 1816 ය. (4) ක්‍රි.ව. 1817 ය.

(17) ශ්‍රී ලංකාවේ පරිපාලන ක්‍රමය විමධ්‍යගත කිරීම සඳහා ක්‍රි.ව. 1973 දී පළමු වරට දරණ ලද උත්සාහය වනුයේ,
(1) දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීම ය. (2) දේශපාලන අධිකාරිය පිහිටුවීම ය.
(3) සුළු නගර සභා අහෝසි කිරීම ය. (4) ප්‍රාදේශීය මණ්ඩල ක්‍රියාත්මක කිරීම ය.

(18) ශ්‍රී ලංකාවේ පැවති පළාත් 09 සඳහා පළාත් සභා පිහිටුවනු ලැබුවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ,
(1) 14 වන සංශෝධනය යටතේ ය. (2) 13 වන සංශෝධනය යටතේ ය.
(3) 15 වන සංශෝධනය යටතේ ය. (4) 11 වන සංශෝධන යටතේ ය.

(19) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභා යන ආයතන දෙවර්ගයට ම සමසේ භුක්තිවිඳිය හැකි බලතල සමගාමී ලැයිස්තුව යටතේ දක්වා ඇත. එයට අයත් වන බලතල වර්ග
(1) 37 කි. (2) 17 කි. (3) 36 කි. (4) 34 කි.

(20) වර්තමානයේ ප්‍රාන්ත 50කින් යුත් සන්ධීය රාජ්‍යය
(1) බෙල්ජියම යි. (2) ප්‍රංශය යි.
(3) ඇමරිකා එක්සත් ජනපදය යි. (4) රුසියාව යි.

(21) "විවිධත්වය තුළින් ඒකීයත්වය ලගා කර ගැනීමට මග සාදන ආණ්ඩුක්‍රමය වේ" යනුවෙන් සන්ධීය ආණ්ඩු සම්බන්ධයෙන් නිර්වචනයක් ඉදිරිපත් කරනු ලැබුවේ.
(1) ඒ.වී.ඩයිසි විසිනි (2) මහාචාර්ය සී.එෆ්. ස්ට්‍රොන්ග් විසිනි
(3) මහාචාර්ය කේ.සී.වියරේ විසිනි (4) මහාචාර්ය හර්මන් ජේ ෆයිනර් විසිනි

(22) 2012 ජනසංගණනය අනුව ජන සංඛ්‍යාවේ ඉස්ලාම් ආගම අදහන ජන සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස දැක්වෙන්නේ,
(1) 12.6% ලෙස ය. (2) 7.4% ලෙස ය.
(3) 0.1% ලෙස ය. (4) 9.7% ලෙස ය.



28

(23) 'වෙනස්කම් තුළින් එකමුතුබව' යන්න තේමාව කර ගනිමින් ආර්ථික, සමාජීය හා දේශපාලන ක්‍රියාවලියේ සංස්කෘතිකභාවය හොඳින් ප්‍රයෝජනයට ගත් රටකට නිදසුනකි.

(1) කැනඩාව (2) යුරෝපය

(3) සිංගප්පූරුව (4) මැලේසියාව

(24) ඕනෑම අර්ථ ක්‍රමයකට මුහුණදීමට සිදුවන ප්‍රශ්න මූලික ආර්ථික ප්‍රශ්න ලෙසින් හැඳින්වේ. ඒවා,

(1) ප්‍රධාන කොටස් හතරකට බෙදිය හැකි ය. (2) ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැකි ය.

(3) ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි ය. (4) ප්‍රධාන කොටස් හයකට බෙදිය හැකි ය.

(25) ආර්ථික නොවන භාණ්ඩ ඇතැම් විට ආර්ථික භාණ්ඩ වන අවස්ථා ද දක්නට ලැබේ. එවැන්නකට උදාහරණයකි.

(1) බෝතල් කළ ජලය (2) ඇඳුම් පැළඳුම්

(3) පොත්පත් (4) විද්‍යුත් උපකරණ

(26) සමාජවාදී වෙළෙඳපොළ ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබෙන රටකි.

(1) චීනය (2) කියුබාව

(3) ඕස්ට්‍රේලියාව (4) ඇමරිකා එක්සත් ජනපදය

(27) • විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීම
• ආනයන අපනයන සීමා ලිහිල් කිරීම
• විදේශ ආයෝජකයන්ට බදු සහන ලබාදීම
• අපනයන මූලික කර්මාන්ත ඇරඹීම

ඉහත දක්වා ඇති ශ්‍රී ලංකාවේ නව සංවර්ධන ප්‍රවණතා ඇතුළත් කාල වකවානුව වනුයේ,

(1) වර්ෂ 1948 - 1960 ය. (2) වර්ෂ 1961 - 1970 ය.

(3) වර්ෂ 1970 - 1977 ය. (4) වර්ෂ 1978 - 1993 ය.

(28) • භූමිය • ශ්‍රමය
• ප්‍රාග්ධනය • ව්‍යවසායකත්වය

ඉහත දක්වා ඇති නිෂ්පාදන සාධකවලට ලැබෙන ප්‍රතිලාභ පිළිවෙළින් පෙන්නුම් කරන වරණය තෝරන්න.

(1) බදුකුලී, ලාභය. වැටුප්, පොළී (2) බදුකුලී, වැටුප්, පොළී, ලාභ

(3) බදුකුලී. ශ්‍රමය, වැටුප්, ලාභ (4) පොළී. බදුකුලී. වැටුප්. ලාභ

(29) නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව ද වර්ග කළ හැකි ය. පහත සඳහන් භාණ්ඩවලින් අන්තර් භාණ්ඩයක් වන්නේ

(1) පොහොර ය. (2) කිරිපිටි ය. (3) ගොඩනැගිලි ද්‍රව්‍ය (4) යන්ත්‍ර සූත්‍ර

(30) • තරගකාරී වෙළෙඳපොළක් පැවැතීම.
• නිෂ්පාදන සාධකවල අයිතිය පෞද්ගලික අංශය සතුවීම.
• ලාභය අරමුණු කරගෙන නිෂ්පාදනය සිදුවීම.
• ආදායම් අසමාන ලෙස බෙදීයාම.

ඉහත සඳහන් වනුයේ,

(1) සමාජවාදී අර්ථක්‍රමයක දැකිය හැකි ලක්ෂණයි.

(2) ධනවාදී අර්ථ ක්‍රමයක දැකිය හැකි ලක්ෂණයි.

(3) මිශ්‍ර අර්ථ ක්‍රමයක දැකිය හැකි ලක්ෂණයි.

(4) වෙළෙඳපොළ ආර්ථිකය දැකිය හැකි ලක්ෂණයි. (........)

17 - 11 - 2016 පුරවැසි අධ්‍යාපනය

(31) වර්ෂ 2012 සංවර්ධනය පිළිබඳ දර්ශක අනුව මානව සංවර්ධන දර්ශකයේ ශ්‍රී ලංකාවට හිමිතැන
(1) 85 ය. (2) 80 ය. (3) 92 ය. (4) 72 ය.

(32) යුරෝපා සංගමයට අයත් සාමාජික රටකි.
(1) ප්‍රංශය (2) කැනඩාව (3) ඉන්දියාව (4) තායිලන්තය

(33) බෙංගාල මුහුදු තීරය අවට රටවල් පිහිටුවා ගත් ආර්ථික සහයෝගීතා සංගමය හඳුන්වන කෙටි නාමය වන්නේ,
(1) NAFTA (2) SAPTA (3) EU (4) BIMST - EC

(34) • විවිධ ජනවර්ග ජීවත්වීම
• විවිධ ආගම් අදහන පුද්ගලයින් සිටීම
• විවිධ භාෂා කතා කරන පුද්ගලයන් සිටීම
• විවිධ ජනවර්ග, විවිධ ආගම් හා බැඳුණු සිරිත් විරිත් හා සම්ප්‍රදායන් දක්නට ලැබීම
ඉහතින් දක්වා ඇත්තේ,
(1) බහු ආගමික සමාජය යන්න යි.
(2) බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණයි.
(3) බහු සංස්කෘතික සමාජයක් ඇති වීම කෙරෙහි බලපාන සාධකයි.
(4) බහු සංස්කෘතික ජන සමාජයේ සාමාජිකයන් ලෙස එක්සත්ව ජීවත්වීමේ වැදගත්කමයි.

(35) A. දූෂණයෙන් වංචාවෙන් තොර රාජ්‍ය පාලනය හා පරිපාලනය.
B. එකිනෙකාගේ දේශපාලන අනන්‍යතාවයට ගරු කිරීම.
C. විනිවිද භාවයකින් යුතුව කටයුතු කිරීම.
D. තමන් කැමති නීත්‍යානුකූල වෘත්තියක හෝ ව්‍යාපාරයක නිරතවීම.
E. කැමැති ආගමක් ඇදහීම.
ඉහත දක්වා ඇති ප්‍රකාශවලින් යහපාලනයක මූලික ගුණාංගයක් පෙන්නුම් කරනුයේ,
(1) A සහ E ය. (2) A සහ B ය.
(3) A සහ C ය. (4) A සහ D ය.

(36) වෙළෙඳපොළ ආර්ථිකයන්හි විවිධ ස්වරූප පවතී. පරිවර්තන ආර්ථිකයක් හෙවත් වෙළෙඳපොළ ආර්ථිකයක් ක්‍රියාත්මක වන රටකි.
(1) ඕස්ට්‍රේලියාව (2) උතුරු කොරියාව
(3) ප්‍රංශය (4) රුසියාව

(37) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සංක්‍රමණ සාධකය ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) ඉන්දියාවට ආසන්නව පිහිටීම (2) සංඝමිත්තා තෙරණිය ඇතුළු පිරිස පැමිණීම
(3) සේන ගුත්තික ආක්‍රමණය (4) චීන ජාතීන්ගේ පැමිණීම

(38) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට සිදුවන සෘණාත්මක බලපෑම් දක්වා ඇති ප්‍රකාශය තෝරන්න.
(1) විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම
(2) කාර්මික හා සේවා අංශවල ප්‍රගතියක් ඇතිවීම
(3) ජාත්‍යන්තර වෙළෙඳපොළ පදනම් කරගත් දේශීය නිෂ්පාදන බිහිවීම
(4) බුද්ධිගලනය වේගවත් වීම



26

(39) ගැටුම් පිළිබඳ ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ලොවට ඉදිරිපත් කරනු ලැබුවේ,

(1) ජොහාන් ගැල්වින් විසිනි. (2) ජොහාන් ගැල්ටුන් විසිනි.

(3) ජොහාන් ස්මිත් විසිනි. (4) ජොහාන් ස්කැපර් විසිනි.

(40) පහත දැක්වෙනුයේ ගැටුම් ඇතිවීම කෙරහි බලපාන මූලයන් A අක්ෂරයෙන් ද එයට නිදසුන් B අක්ෂරයෙන් ද දැක්වේ. A සහ B එකිනෙකට ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| A | B |
|---|---|
| (1) වාර්ගිකත්වය | A. සෝමාලියාව, ඉතියෝපියාව ගැටුම |
| (2) දේශපාලන | B. දකුණු අප්‍රිකාවේ වර්ණභේද ගැටුම |
| (3) සමාජ ආර්ථික තත්ත්වය | C. අයර්ලන්ත යුද්ධය |
| (4) ආගමික මතවාද | D. ජාත්‍යන්තර ත්‍රස්තවාදය |
| | E. ඊශ්‍රාලය, පලස්තීන ගැටුම |

(1) ABCD (2) BDEC

(3) BEAC (4) ABDC



27

15506

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:
- පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) (i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීමට භාවිත කරන ප්‍රධාන නිර්නායක දෙක නම් කරන්න. (ලකුණු 02)

(iii) ශ්‍රී ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක සිතියමේ අංක 7 සහ 9 යෙන් දක්වා ඇති දිස්ත්‍රික්ක දෙක නම් කරන්න. (ලකුණු 02)

(iv) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ඡන්ද දායකයකු සතු අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(v) රාජ්‍යය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(vi) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු සතු යුතුකම් දෙයාකාරයකට වර්ග කර දැක්විය හැකි ය. ඒවා නම් කරන්න. (ලකුණු 02)

(vii) බලය විමධ්‍යගත කිරීමේ දී දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(viii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, ව්‍යවස්ථා සංශෝධනයට අනුව ලැයිස්තු 03ක් පදනම් කරගෙන වර්ගීකරණය කර ඇත. ඉන් 1වන හා 11 ලැයිස්තුව නම් කරන්න. (ලකුණු 02)

(ix) තිරසාර සංවර්ධනයේ දී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න. (ලකුණු 02)

(x) මනසේ සාමය ඇති කර ගැනීම සඳහා යොමුවිය හැකි අංශ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(ලකුණු 02 x 10 = 20)

(02) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ස්වරූප දෙකක් දැකිය හැකි ය.

(i) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වූ ග්‍රීසියේ පිහිටි පෞර රාජ්‍යය හා එහි ප්‍රධාන පාලන ආයතනය හඳුන්වන නම් ලියන්න. (ලකුණු 02)

(ii) පාලන ක්‍රමයක් ලෙස සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටළු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) සමාජ හා ජීවන ක්‍රමයක් ලෙස ද ප්‍රජාතන්ත්‍රවාදය වැදගත් වේ. මෙම ප්‍රකාශය සනාථ කළ හැකි කරුණු තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(03) රටක මූලික නීතිය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.

(i) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇති කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී රටක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම නිසා ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී රටක මහජන මතය ගොඩ නැගීම සඳහා බලපාන ප්‍රධාන සාධකයක් වූ ජන මාධ්‍යයය විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(04) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13වන සංශෝධනය හා 1987 අංක 42 දරන පාර්ලිමේන්තු පනත මගින් ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ඇති කරනු ලැබීය.

(i) පළාත් සභාවක ජනාධිපතිවරයා විසින් පත්කරන නිලධාරියාගේ තනතුර හා ඔහුගේ නිල කාලය සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පළාත් සභාවක මහ ඇමති හා අමාත්‍ය මණ්ඩලය සතු බලතල හා කාර්යයන් තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) පළාත් සභාව සතු කාර්යයන් තුනක් දක්වා ඉන් එකක් විස්තරයක් කරන්න. (ලකුණු 05)

(05) තාක්ෂණයත් සමඟ ලෝකය සමීප වීම ගෝලීයකරණය ලෙසින් ව්‍යවහාර කරනු ලැබේ.

(i) ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ගෝලීයකරණය තුළ ලොවම තනි ආර්ථික ඒකකයක් බවට පත් කිරීම සඳහා ලෝක බලවතුන් පිහිටුවාගෙන ඇති සංවිධාන තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ගෝලීයකරණය ලෝක ආර්ථිකයට කරන බලපෑම් තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(06) 2004 වර්ෂයෙන් පසුව ශ්‍රී ලංකාව දේශීය කෘෂි අංශය හා ආයෝජන කෙරෙහි අවධානය යොමුවීමක් සිදුව ඇත.

(i) දේශීය කෘෂි ආර්ථිකය සංවර්ධනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) රට තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා දියත් කර ඇති වැඩ සටහන් තුනක් දක්වන්න. (ලකුණු 03)

(iii) වර්තමානයේ ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ක්‍රියා නිසා ශ්‍රී ලංකාව අත්පත් කරගෙන ඇති වාසි තුනක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) මිනිසුන් තුළ පවත්නා විවිධත්වය ගැටුම තුළින් පිළිබිඹු වේ.

(i) ගැටුම් වර්ග අධ්‍යයනය කළ හැකි ක්ෂේත්‍ර දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ගැටුම් නිරාකරණය සඳහා යොදාගත හැකි ක්‍රමවේද තුනක් දක්වන්න. (ලකුණු 03)

(iii) සාමකාමී ජීවන පැවැත්මක් අපේක්ෂා කරන ශිෂ්‍යයෙකු ලෙස ඔබ අභියෝග ජය ගැනීම සඳහා ප්‍රගුණ කල යුතු පුද්ගල ගුණාංග තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)